# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2014 අංක 42 දරන කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2014 නොවැම්බර් මස 24 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2014 නොවැම්බර් මස 28 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 11.00 යි. තැපැල් ගාස්තුව : රු. 50.00 යි.

# 2014 අංක 42 දරන කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2014 නොවැම්බර් මස 24 වන දින]

එල්. ඩී.—ඕ. (අයි. එන්. සී.) 23/2012.

## කල්පවෘක්ෂ සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"කල්පවෘක්ෂ සංවර්ධන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුව, එකී පදනමට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2014 අංක 42 දරන කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

කල්පවෘක්ෂ සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

**2.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) "කල්පවෘක්ෂ සංවර්ධන පදනමේ" දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් ද (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "කල්පවෘක්ෂ සංවර්ධන පදනම" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේ ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

(2) සංස්ථාව 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ

2—PL 005785—2800 (2014/10)

එහි කාර්ය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, සංස්ථාවේ කටයුතු කළමණාකරණය සඳහා සහ ඒ සම්බන්ධයෙන් එකී පනතේ විධිවිධාන අදාළ වන්නේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) පුද්ගලයින් හා ජාතීන් අතර, සහජීවනය වර්ධනය කිරීම තුළින් සාමය ප්‍රවර්ධනය කිරීම;

(ආ) පාරිසරික සුරක්ෂිතභාවය ආරක්ෂාකර ගැනීම හා සමාජ සංවර්ධනය උදෙසා බෞද්ධාගමිකයන් පෙළඹවීම;

(ඇ) පුද්ගලයන් කේන්ද්‍රීයකොට ගත් සමාජ සංවර්ධන ක්‍රියාවලිය දියත් කිරීමත්, විශේෂයෙන් බෞද්ධ ළමුන්ට බලපාන ගැටළු අවම කිරීම පිණිස බෞද්ධ ප්‍රජාව මෙහෙයවීම;

(ඈ) විහාරස්ථානයේ ආරක්ෂාව, නඩත්තුව හා සංවර්ධනය සලසාදීම;

(ඉ) නේවාසික භික්ෂුන් වහන්සේලාගේ ආරක්ෂාව, දානය සහ උන්වහන්සේලාගේ දෛනික අවශ්‍යතාවයන් සපුරාලීම;

(ඊ) විහාරස්ථාන පරිශ්‍රයේ ආගමික කටයුතු සංවිධානය කිරීම;

(උ) බෞද්ධ චර්යා ධර්ම පදනම් කොට ගනු ලැබුවා වූ ද, පන්සිල් රකින්නා වූ ද, ආගමික ජීවන විලාසයකට බාල, මහලු බෞද්ධයන් සියලු දෙනාම යොමු කිරීම;

(ඌ) දහම් පාසලක් පිහිටුවීම හා නඩත්තු කිරීම, විභාග පැවැත්වීම, තරග සංවිධානය කිරීම, දහම් පාසල් උපකරණ ආදී අවශ්‍යතා සපුරාලීමට කටයුතු කිරීම;

(එ) ශ්‍රී පාද ප්‍රදේශයේ දී හදිසි ආපදාවලට මුහුණ දෙන බැතිමතුන්ට ප්‍රතිකාර කිරීමේ අරමුණින් අදාළ බලධාරීන්ගේ අනුමතය ඇතිව ආරෝග්‍යශාලාවක් පිහිටුවා නඩත්තු කිරීම;

(ඒ) විහාරස්ථානයේ පැවිදි වන ස්වාමීන් වහන්සේලාගේ අධ්‍යාපන කටයුතු හා පුහුණුවීමේ අවශ්‍යතාවය ගැන සොයා බලා ඒවා සපුරා ගැනීමට ආධාර කිරීම;

(ඔ) බුදු දහමේ තිරසාර පැවැත්ම සඳහා ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා, ආදී ආගමික කටයුතු සංවිධානය කිරීම;

(ඕ) බෞද්ධ ප්‍රතිපත්ති පදනම්කොට ගෙන විහාරස්ථානයේ හා ඒ අවට ප්‍රදේශයේ දියුණුවට පෙරහැර, පිංකම්, දානමානා දී කටයුතු හා වෙනත් ස්වෙච්ඡා කටයුතු සංවිධානය කිරීම.

**4.** රජයේ හෝ පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් හෝ විසින් සමගාමීව සිදු කරනු ලබන කටයුතු සහ සංස්ථාවේ කටයුතු අතර, යම් ගැටුමක් ඇති නොවන පරිදි සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු වේ.

මධ්‍යම රජයේ හෝ පළාත් අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කටයුතු සමග ගැටුම් ඇති නොවන බවට සංස්ථාව සහතික විය යුතු බව.

**5.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වනු ලබන නිලධරයන් ගණනකින් සමන්විත වන (මෙහි මින්මතු "මණ්ඩලය" ලෙස සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් විසින් සිදුකළ යුතු වේ.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) (අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරනු ලැබූ පදනමේ කළමනාකරණ මණ්ඩලය, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි සංස්ථාවේ ප්‍රථම මණ්ඩලය පත්කරනු ලබන තෙක් හෝ තෝරාගනු ලබන තෙක් එහි මණ්ඩලය වශයෙන් ක්‍රියාත්මත විය යුතු ය.

(ආ) මේ පනත ආරම්භවන දින සිට එක් අවුරුද්දක් ඇතුළත සංස්ථාවේ ප්‍රථම මණ්ඩලය පත්කිරීම හෝ තෝරාගැනීම කරනු ලැබිය යුතු ය.

(3) (අ) අනුශාසකවරුන් සහ උපදේශකවරුන් ඇතුලුව මණ්ඩලයේ සෑම නිලධරයකුම අවුරුදු තුනක කාලයක් සඳහා පත්කිරීම හෝ තෝරාගනු ලැබීම කළයුතු අතර, එකී අවුරුදු තුනක කාලය අවසන්වීමෙන් පසුව එකී නිලධරයා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත්වීම හෝ තේරීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(ආ) යම් නිලධරයෙකු මියයෑම, ඉල්ලා අස්වීම, අශක්නුතාවකට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් එම ධුරයේ යම් පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, මණ්ඩලය විසින් සංස්ථාවේ රීති පිළිබඳ සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව සඳහා වෙනත් තැනැත්තකු තෝරා ගැනීම හෝ පත්කිරීම කරනු ලැබිය යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරාගත් හෝ පත් කරනු ලැබූ තැනැත්තා තමා අනුප්‍රාප්ත වනුයේ යම් සාමාජිකයකුගේ ඉතිරි ධුර කාලය සඳහා ද එම කාලය සඳහා පමණක් ධුරය දරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ බලතල.

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, පහත සඳහන් බලතල ද ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් එක් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය ක්‍රියා සහ කාරණා කිරීමට, ඉටු කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ඉඩම් හෝ ගොඩනැගිලි මිල දී ගැනීම, අත්කර ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම, නවීකරණය සහ අන්‍යාකාරයකින් ලබාගැනීම සහ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුතුව වහා අවශ්‍ය බවට සලකනු ලබන ආකාරයට එම ඉඩම් ගොඩනැගිලි කටයුතු කිරීම හෝ බැහැර කිරීම;

(ආ) ඇප අතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීම සහ ලබා ගැනීම සහ මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් හෝ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම;

එසේ වුවද, සංස්ථාව වෙත කරන ලද සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මණ්ඩලය විසින් මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ

අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ඒ සඳහා ලබා ගත යුතු වේ.

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගණුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට හා නිකුත් කිරීමට සහ යම් බැංකුවක බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහා ම අවශ්‍ය නොවන මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරන ආකාරයට ආයෝජනය කිරීම;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා යම් නීත්‍යානුකූල භාරයක් හෝ දේපළක් හෝ පුද්ගලික දේපළක් භාරගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය;

(ඊ) සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් පිළිබඳ විනය පාලන කටයුතු ක්‍රියාත්මක කිරීම සහ සංස්ථාව විසින් නිශ්චය කරනු ලබන පරිදි යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීම;

(උ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කරගැනීම සඳහා දේශන, සම්මන්ත්‍රණ සහ සම්මේලන සංවිධානය කිරීම;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ හා සමාන පරමාර්ථ ඇති වෙනත් දේශීය සහ විදේශීය ආයතන සමග සහයෝගයෙන් ක්‍රියාකිරීම සහ සම්බන්ධීකරණය කිරීම;

(එ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයන්හි දී සේවා නියුක්තකයන් පුහුණු කිරීම; සහ

(ඒ) සංස්ථාවේ පරමාර්ථ නිසි පරිදි සහ සාධනීය ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍යවන හෝ උපයෝගීවන සියලු වෙනත් ක්‍රියා සිදු කිරීම.

සංස්ථාවේ රීති.

**7.** (1) සංස්ථාව විසින් මෙහි පහත සඳහන් සියලුම කරුණු හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන්නාවූ රීති, සංස්ථාවේ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, කලින් කල, සෑදීම නීතයනුකූල වන්නේ ය:—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, සාමාජිකත්වයෙන් ඉවත්වීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවනු ලැබිය යුතු ගාස්තු;

(ආ) මණ්ඩලයේ නිලධරයන් තේරාගැනීම, ඔවුන්ගේ ධුරයන්හි පුරප්පාඩු හෝ ධුරයෙන් ඉවත්කිරීම සහ නිලධාරී මණ්ඩලයේ කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, නියෝජිතයන් සහ සේවකයන් පත්කිරීම පිළිබඳ නියම හා කොන්දේසි සහ ඔවුන්ගේ බලතල, කාර්‍ය සහ කර්තව්‍ය;

(ඈ) මණ්ඩලයේ හෝ එහි යම් උප කමිටුවක රැස්වීම කැඳවීමේ සහ රැස්වීම් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි එම රැස්වීම් පිළිබඳ නිවේදන සහ න්‍යාය පත්‍රය එහි ගණපූරණය සහ කටයුතු පැවැත්වීම;

(ඉ) මණ්ඩලයේ සහ සංස්ථාවේ සාමාජිකයකුවීම සඳහා වූ සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඊ) සංස්ථාවේ දේපල, පරිපාලනය සහ කළමනාකරණය; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ එහි පරමාර්ථ මුදුන්පත්කර ගැනීම මෙන්ම සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදන ආකාරයටම, එවැනිම රැස්වීමක දී සිදුකළ යුතු වේ.

(3) සංස්ථාවේ සාමාජිකයන් සෑම අවස්ථාවක දීම මේ වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

සාමාජික නාම ලේඛණය.

**8.** සාමාජිකයන්ගේ නම, ලිපිනය සහ වෙනත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කළ යුතු සාමාජික නාමලේඛනයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු මුදල් මණ්ඩලය විසින් එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදුකිරීමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

විගණනය සහ ගිණුම්.

10. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් ස්වකීය ආදායම සහ වියදම, වත්කම් සහ වගකීම් මෙන්ම සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තබා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සංස්ථාවේ ගිණුම් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මෙම වගන්තියේ කාර්ය සඳහා "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන්

වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව, සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්, හෝ

අදහස් වේ.

වාර්ෂික වාර්තාව.

**11.** (1) කළමනාකරණ මණ්ඩලය විසින් එක් එක් මුදල් වර්ෂය සඳහා සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කර විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය ද සමග එම වාර්තාව බුද්ධ ශාසන සහ ආගමික කටයුතු විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම්වරයා වෙත සහ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධානය (ලියාපදිංචි කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ) පනත යටතේ පත්කරනු ලැබූ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත වාර්තාව අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ මාස හයක කාලයක් ඉකුත් වීමට පෙරාතුව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාවට ලැබෙන විදේශීය සහ දේශීය මුදල් පිළිබඳ වෙනම ගිණුම් වාර්තාවක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව සමග අමුණා තිබිය යුතු ය.

සංගමය විසින් සහ සංගමයට ගෙවිය යුතු මුදල්.

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පදනමෙහි පැවති සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට ගෙවිය යුතු සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**13.** මේ පනතේ විධිවිධානවලට යටත්ව යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාරව හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව තිබිය යුතු අතර, මේ පනතේ කාර්ය

සඳහා 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව, එවැනි සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, සංස්ථාව විසින් දැරිය යුතු ය.

**14.** කවර ආකාරයකට හෝ ලබාගන්නා සංස්ථාවේ මුදල් සහ දේපළ සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම කෙරෙහි පමණක් අදාළ කරගනු ලැබිය යුතු අතර, එහි යම් කොටසක් සංස්ථාවේ සාමාජිකයන් වෙත සෘජුවම හෝ වක්‍රව ලාභාංශ, ප්‍රසාද දීමනා, හෝ ලාභ වශයෙන් ගෙවීම හෝ පැවරීම නොකළ යුතු වේ. මුදල් හා දේපළ අදාළවීම.

**15.** (1) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

(2) සංස්ථාවේ මුද්‍රාව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන මණ්ඩලයේ ධුර දරන්නකු භාරයේ තැබිය යුතු ය.

**16.** (1) සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර නොබෙදනු ලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට ලබා දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. විසුරුවා හැරීමේදී ඉතිරිවන දේපළ.

(2) මෙහි (1) උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය හෝ ආයතක කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හැරීමට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයින් විසින් මහා සභා රැස්වීමක දී පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය.

**17.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**18.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.